ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

Article 12 (1)

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2021-11-29 |

පැමිණිලි පාර්ශවය : එච්.එම්.පී.එන්.කේ.කළුහෙන්දිවල මයා,
නුගහපොල වලව්ව,
පල්දෙණිය, මහවෙල.

වගඋත්තරකාර පාර්ශවය :

01. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

02. ගොවිජන සංවර්ධන නිලධාරී,
ගොවිජන සේවා මධ්‍යස්ථානය,
පලාපත්වල, මාතලේ.

03. කෘෂි පර්යේෂණ හා කෘෂි නිෂ්පාදන සහකාර,
E 327, අළුවිහාර කොට්ඨාසය,
ගොවිජන සේවා මධ්‍යස්ථානය,
පලාපත්වල, මාතලේ.

**පැමිණිලි අංකය : එච්.ආර්.සී/2927/17**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

පැමිණිලිකරු තම පැමිණිල්ල තුළින් දක්වා ඇත්තේ ඔහුට හිමි පුද්ගලික ගොඩ ඉඩම් දේපලකට එරෙහිව **02** වන වගඋත්තරකරු සහ **03** වන වගඋත්තරකරු විසින් මූලික අයිතිවාසිකම් කඩ කරමින් කටයුතු කර තිබීම මත තම දේපල සංවර්ධනය කර ගත නොහැකිව සිටින බව යි. ඒ සම්බන්ධව කරුණු දක්වා සියළුම වගඋත්තරකරුවන් වෙත කළ අභියාචනා නොසළකා හරින ලද බවද නීතිමය වශයෙන් හිමි සහන ලබා නොදී සිටිමින් ක්‍රියා කරන බවද පළමු වගඋත්තරකරු විසින් මෙම ගැටළු සහගත තත්ත්වය



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.
සභාපති / தவிசாளர் : 011-2505451
ෆැක්ස් / தொலைநகல் : 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் : sechrc@gmail.com

විසඳීමට පියවර ගෙන නිකුත් කළ ලේඛන වලටද එරෙහිව 02 වන සහ 03 වන වගඋත්තරකරුවන් පසුව දිගින් දිගටම කටයුතු කරන බව ද වැඩිදුරටත් තම පැමිණිල්ලෙන් දක්වා තිබේ.

මාතලේ අළුවිහාරේ කෘෂි පර්යේෂණ සහකාර නිලධාරී කොට්ඨාසයට අයත් මෙම දේපළ සින්නක්කර ඔප්පුවක් මත තමා නිරවුල්ව මිළදී ගෙන භුක්ති විඳින බව ද යාබද කුඹුරු ඉඩම් සමග එක්ව හෝ යාබදව පිහිටා තිබීමේ හේතුව මත තවදුරටත් තම පුද්ගලික දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා වැට මායිම් සකස් කර ගැනීමට යාමේදී එකී දේපළ කුඹුරු ඉඩමක් බවට ප්‍රකාශ කරමින් වගඋත්තරකරුවන් ක්‍රියා කරන බව ද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් මුල් අවස්ථාවේ සිටම මෙකී දේපළ කුඹුරු ඉඩමක් නොවන බවට ප්‍රකාශ කර තිබියදී තවදුරටත් පොලිස් ස්ථාන වෙත පැමිණිලි කරමින් හෝ විවිධ විමර්ශන කටයුතු සඳහා යයි පවසමින් ලිපි නිකුත් කරමින් 02 වන සහ 03 වන වගඋත්තරකරුවන් විසින් ද්වේශ සහගතව කටයුතු කර ඇති බව පැමිණිල්ලෙන් දක්වා තිබේ. එබැවින් 1978 ශ්‍රී ලංකා නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ මූලික අයිතිවාසිකම් යටතේ ව්‍යවස්ථාපිත 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමකට තමා ලක්ව ඇති බව තහවුරු කර ඉල්ලා ඇති සහන ලබාදෙන ලෙස වැඩිදුරටත් දක්වා තිබේ.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :**

වගඋත්තරකරුවන් වෙතින් වාර්තා කැඳවා තිබූ අතර ඒ අනුව වගඋත්තරකරු විසින් එවා ඇති වාර්තාව වෙත අවධානය යොමු කිරීමේදී පහත සඳහන් කරුණු දක්වා ඇති බව අනාවරණය වේ.

ආර්.සී.ටී.ඩබ්.එම්.පී.එම්.කැප්පෙටිපොල, මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද අංක 794 දරණ ඔප්පුවේ විෂයගත දේපළ මෙම ප්‍රශ්නගත දේපළ බව ද ගොඩ ඉඩමක් ලෙස භාවිතා කරන බව පැමිණිලිකරු ප්‍රකාශ කළද එකී දේපළ කුඹුරු ඉඩමක් බව 02 සහ 03 වගඋත්තරකරුවන් ප්‍රකාශ කර සිටී. පෙර හිමිකරු වන ඩී.එම්.සී.පියරත්න යන අය විසින් 2017.02.17 දිනැති අංක : 7/11/19/එම්එල්/211 සහතිකය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙතින් කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් ලබාගෙන තිබෙන බවද වැඩිදුරටත් දක්වා තිබේ. පසුව පැමිණිලිකරු විසින් මෙම දේපළ මිළදී ගෙන ඇති බවද පැමිණිලිකරුගේ නමින් ද කුඹුරු ඉඩමක් නොවන බවට සහතිකයක් 2017.02.20 දින අංක සීපී/002/පොදු අංකය යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස් වෙතින් නැවත ලබාගෙන තිබී ඇති බවද පසුව මෙම සහතික දෙකම 2017.04.28 දින ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් අවලංගු කර කිසිදු සංවර්ධනයක් නොකරන ලෙස දන්වා තිබී ඇති බව වැඩිදුරටත් දක්වා ඇත. එමෙන්ම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ලිඛිත අවසරයක් නොගෙන කුඹුරු ඉඩමේ සංවර්ධන කටයුතු කිරීමට එරෙහිව 03 වන වගඋත්තරකරු මාතලේ පොලීසිය වෙත පැමිණිලි කර නීතිමය කටයුතු සිදු කර ඇති බව පෙන්වා දී තිබේ. කුඹුරු ඉඩමක් නොවන බවට සහතික ලබාගෙන ඇත්තේ ප්‍රාදේශීය හෝ දිස්ත්‍රික් මට්ටමින් කිසිදු නිර්දේශයක් ලබාගෙන නොවන බව ද ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ද කිසිදු ලිපිගොනුවක් මීට අදාළව නොමැති බව පෙන්වා දෙමින් ඊට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවද දක්වා තිබේ.

**පරීක්ෂණයේදී අනාවරණය කරගත් කරුණු :**

අවස්ථා කිහිපයකදී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිලිකරු සහ වගඋත්තරකරුවන් කැඳවා පරීක්ෂණ කටයුතු සිදු කර තිබූ අතර ඒ අනුව ඒ ඒ පරීක්ෂණ දින අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

2018.10.18 දින පරීක්ෂණ අවස්ථාවේදී පැමිණිලිකරු තමා සින්නක්කර ඔප්පුවක් මගින් මිලදී ගත් දේපලට අදාළ ඔප්පුව ඉදිරිපත් කර කරුණු පැහැදිලි කළ අතර එය පරීක්ෂා කර බැලීමේදී පෙනී යන්නේ එය නිත්‍යානුකූලව ලියාපදිංචි කරන ලද ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සකස් කරන ලද ඔප්පුවක් බවය. චන්ද්‍රන පියරත්න නම් අයෙකු සතුව තිබූ දේපලක් පැමිණිලිකරු විසින් මිලදී ගෙන ඇති බව ද ඉන් පෙනී යයි. දේපලට යාබදව පිහිටා ඇති කුඹුරු ඉඩමක් පිහිටා තිබීම මත මෙම දේපල ද කුඹුර සහ පිල්ලෑව ලෙස සඳහන්ව ඇති බැවින් පැමිණිලිකරු වගඋත්තරකරුවන් වෙතින් විමසා ඇත්තේ ඉඩමේ නම එසේ තිබුණද මෙය කුඹුරු ඉඩමක් ලෙස සැලකිය හැකිද යන්න සොයා බැලීම සඳහා කුඹුරු ඉඩම් නාම ලේඛනයේ උධෘතයක් 02 වන වගඋත්තරකරු වෙතින් ඉල්ලීමක් කළ බවය. වගඋත්තරකරු එහිදී පෙන්වා දී ඇත්තේ මාතලේ අඹවිහාර කොට්ඨාසයට අදාළව පවත්වාගෙන යන කුඹුරු ඉඩම් නාමලේඛනයේ මෙම පිල්ලෑව හෝ අස්වැද්දුම කුඹුර නම් ඉඩමක් පිළිබඳව තොරතුරු පළාපත්වල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඇති කුඹුරු ඉඩම් නාම ලේඛනය තුළ නොමැති බවය. ඒ අනුව මුල් ඉඩම් හිමිකරු වෙත ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ලිඛිතවම සහතිකයක් ලබාදී ඇත්තේ මෙම ඉඩම කුඹුරු ඉඩමක් නොවන බවට යන්නද ලේඛන පෙන්වා තහවුරු කර සිටින ලදී. එමෙන්ම අදාළ වසමේ ප්‍රාදේශීය සභාව විසින් ද මෙම දේපලට අදාළව මැන සාදන ලද පිඹුරේ කට්ටි සැලැස්ම ගොඩ ඉඩමක් ලෙස අනුමත කළ බව පෙන්වා දෙන ලදී. තවද ඔප්පුව ලියාපදිංචිය සඳහා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයට යොමු කරන අවස්ථාවේ අදාළ පත්‍රිකාවේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් කුඹුරු ඉඩමක් නොවන බවට තීරණය කර ගොඩ ඉඩමක් බවට දක්වා ඇති බව ද අදාළ පත්‍රිකාවේ සටහන් යොදා එය දක්වා ඇති බව ද පෙන්වා දෙන ලදී. එසේ තිබියදී 03 වන වගඋත්තරකරු විසින් 2017.09.04 දින කුඹුරු ඉඩමක් අනවසරයෙන් වෙනත් ආකාරයකට භාවිතා කරන බවට දක්වා බලපෑම් කරන බව ද ඔහු පොලිස් ස්ථානය වෙත පැමිණිලි කරමින් හා දේපලේ සංවර්ධන කටයුතු වලට එරෙහිව ක්‍රියා කරන බව ද පැමිණිලිකරු පෙන්වා දෙන ලදී. වගඋත්තරකරුවන් මෙදින ඉදිරිපත්ව නොසිටි බැවින් නැවත පරීක්ෂණයට දින නියම කරන ලදී.

2018.11.09 දින පරීක්ෂණ අවස්ථාවට ද වගඋත්තරකරුවන් ඉදිරිපත්ව නොතිබීම මත පැමිණිලිකරු හට තවදුරටත් කරුණු දැක්වීමට ඉඩ ලබාදෙන ලද අතර වැඩිදුරටත් තම පැමිණිල්ලේ කරුණු තහවුරු කිරීමට පියවර ගනිමින් වැඩිදුර ලේඛන ගොනුවට ලබාදෙමින් පෙර කියා සිටි කරුණුම තවදුරටත් පැමිණිලිකරු කියා සිටින ලදී.

2019.06.03 දින පරීක්ෂණ අවස්ථාවට 02 වන වගඋත්තරකරු සහ 03 වන වගඋත්තරකරු ඉදිරිපත්ව සිටි අතර එහිදී වගඋත්තරකරුවන් ප්‍රකාශ කරන ලද්දේ මෙම දේපල වටා වැට මායිමක් සකස් කර ස්ථිර භෝග සිටුවීමට පැමිණිලිකරු කටයුතු කිරීම මත ගොවිජන සංවර්ධන පනත ප්‍රකාරව ඊට එරෙහිව දැනුම්දීමක් සිදු කර ඇති බව ය. මෙහිදී පැමිණිලිකරු ස්ථිර භෝග සිටුවීමක් නොකළ බව කියා සිටි.

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ බලපත්‍රය මත ගොඩ ඉඩමක් ලෙස සැලකීම තවදුරටත් අවලංගු කළ බව ප්‍රකාශ කිරීම අසත්‍ය බව පැමිණිලිකරු පෙන්වා දෙමින් තවදුරටත් ගොඩ ඉඩමක් ලෙස තම දේපළ සැලකීමට ලක්වියයුතු බව පෙන්වා දෙන ලදි. එමෙන්ම තවදුරටත් කුඹුරු ඉඩම් නොවන බවටද ගොඩ ඉඩම් ලෙස සැලකියයුතු ඉඩම් පිළිබඳව දක්වා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ලබාදෙන ලද බලපත්‍ර ප්‍රකාරව මෙම දේපළට යාබදව තවත් කුඹුරු හිමියන් විසින් නිවාස පවා තනා සංවර්ධන කටයුතු කළ ද ඒවාට එරෙහිව කටයුතු නොකරමින් තම දේපළට පමණක් එරෙහිව සිදු කරන වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපයන් නවතා දෙන ලෙස පැමිණිල්ල ඉල්ලීමක් කරන ලදි. නමුත් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ දේපළට හිමිකම් කී මුල් හිමිකරු විසින් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙතින් ලබාගත් ගොඩ ඉඩමක් බවට වූ බලපත්‍රය පසුව අවලංගු කර තිබීම මත ද; 2015 වසරේ සිට ද මෙම විෂයගත කුඹුරු ඉඩමට පොහොර ද ලබාගත් බවට හා වගා කළ බවට කරුණු ලේඛන ගතව ඇති බැවින් ද ඉහත කී පරිදි ගොඩ ඉඩමක් ලෙස සැලකීමට සහ 03 වන වගඋත්තරකරුවන් අකමැත්ත පල කර සිටී. මුල් හිමිකරුගේ ඉහත කී බලපත්‍රය අවලංගු කිරීම නැවත ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් වලංගු කරන ලද බවට තහවුරු කරන්නේ නම් ගැටළුවක් නොමැති බව ද පෙන්වා දෙන ලදි.

මෙහිදී පැමිණිලිකරු වැඩිදුරටත් පෙන්වා දෙනු ලබන්නේ තම දේපළ ගොඩ ඉඩමක් බවට සහතික කරන ලද ගොවිජන සංවර්ධන කොමසාරිස් එම්.ඒ.එස්.වීරසිංහ මහතා විසින් කුඹුරු ඉඩම් නොවන බවට හා ගොඩ ඉඩම් ලෙස සැලකියහැකි දේපළ සම්බන්ධව ගොවිජන සංවර්ධන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ඔහු වෙත පැවරී ඇති බලතල යටතේ දෙන ලද ගොඩ ඉඩම් බවට ප්‍රකාශිත බලපත්‍ර ලේඛන පසු කාලීනව පැමිණි ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරුන් විසින් තම කැමැත්ත ප්‍රකාරව විවිධ අවස්ථාවල විවිධ වූ හේතූන් මත ගොඩ ඉඩම් ලෙස සැලකීමට පියවර ගැනීම ද යම් යම් තෝරාගත් බලපත්‍ර අවලංගු කිරීමට පියවර ගැනීම ද තුළින් ගැටළු රාශියක් පැනනැගී ඇති බවය. තම කැමැත්ත ප්‍රකාරව හෝ අවශ්‍යතාවය පරිදි කටයුතු කිරීම මත මෙසේ ක්‍රියා කිරීමෙන් නීතියේ ඇති සර්වසාධාරණත්වයේ හා සමානාත්මතාවයේඅයිතිවාසිකම තමාට අහිමි ව ඇති බව ද පෙන්වා දෙන ලදි.

2019.06.27 දින පරීක්ෂණ අවස්ථාවට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කළ ඩී.ඩී.බන්දුලසේන මහතා වගඋත්තරකරු ලෙස කැඳවා සිටි අතර පැමිණිල්ල පිළිබඳ පැහැදිලි කර දෙමින් කරුණු විමසා සිටින ලදි. පැමිණිලිකරුගේ සින්නක්කර ඉඩමේ උපලේඛනය තුළ කුඹුරු ඉඩමක් ලෙස සඳහන්ව තිබුණද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2017.04.28 දිනැති අංක : 7/11/19/එම්එල්211 දරණ ලිපිය මගින් දේපලේ මුල් හිමිකාර පියරත්න යන අය වෙත මෙම දේපළ ගොඩ ඉඩමක් බවට දක්වා නිකුත් කරන ලද බලපත්‍රය පසුව නැවත අවලංගු කරන ලද්දේ කවිරුන්ද යන්න හා එය නිවැරදි විය යුත්තේ කෙලෙසද යන්න විමසා සිටින ලදි. වගඋත්තරකරු කියා සිටින්නේ, තමා මෙම තනතුරේ වැඩ භාරගත් පසු සීපී/002/පොදු නැමැති ලිපි ගොනුවකින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් යම් යම් අය වෙත කුඹුරු ඉඩම් නොවන බවට සහතික නිකුත් කර ඇති බව පෙනී ගිය බවද එකී කටයුතු පෙර කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කළ එම්.ඒ.එස්.වීරසිංහ මහතා විසින් සිදු කර ඇති බව ද එවැනි ලිපිගොනුවක් හෝ එම සහතික වල පිටපත් දෙපාර්තමේන්තුව සතුව නොමැති බව හඳුනා ගැනීමෙන් අනතුරුව පොදු අංකය යටතේ නිකුත් කරන ලද බවට හඳුනා ගත් සහතික සියල්ල තාවකාලිකව අවලංගු කළ බවයි. හෙත් මෙම දේපළට අදාළව 2017.02.14 දිනැතිව

07/11/19/එම්එල්/211 යටතේ නිකුත් කල ගොඩ ඉඩමක් බවට වූ බලපත්‍රය අවලංගු කල එකක් නොවන බව ද එය කොමසාරිස් ජනරාල් ලෙස තමා විසින් අවලංගු කල ලිපි වලට අදාල එකක් නොවන බව ද පෙන්වා දෙන ලදි. එමෙන්ම 02 වන හා 03 වනවගඋත්තරකරුවන් විසින් පෙන්වා දෙන ලද අවලංගු කරන ලද බවට ප්‍රකාශිත ලේඛනය හා මෙම දෙවන වරට නිකුත් කල ලේඛනය අතර ගැටීමක් ඇති නොකරන බව පෙනී යන බව ද පෙන්වා දෙන ලදි. ඒ අනුව ඔහු විසින් කරන ලද ප්‍රකාශ වලට අදාලව සහතික වෙමින් පරීක්ෂණ දින සටහන් ප්‍රකාශයේද අත්සන් තබා සහතික කරන ලද බව ද වැඩිදුරටත් අනාවරණය කරමි.

**නිරීක්ෂණ සහ නිගමන :**

පැමිණිලිකරුගේ දේපල සින්නක්කර ඔප්පුවක් මත මිලදී ගන්නා ලද දේපලක් බව අනාවරණය වේ. කුඹුරු ඉඩමකට යාබදව පිහිටා තිබීම හෝ ඔප්පුවේ උප ලේඛනය තුළ පිල්ලෑව හා කුඹුරු ඉඩමක් ලෙස සඳහන්ව තිබීම මත මෙම ගැටළුව පැනනැගී ඇති බව පෙනී යයි. මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාතලේ ප්‍රාදේශීය සභා බලසීමාවේ අළුවිහාරේ ග්‍රාම නිලධාරී වසමේ තොටගමුව ග්‍රාමයේ පිහිටි මෙම දේපලට කරදගහමුල කුඹුරේ පිල්ලෑව හෙවත් අස්වැද්දුම ලෙස හා එනමින් කුඹුර ලෙස සඳහන්ව තිබීම මත මෙම ගැටළුව පැන නැගී ඇති බව පෙනී යයි. මුල් හිමිකාර ඩී.එම්.සී.පියරත්න යන අය හට ගොවිජන සංවර්ධන කොමසාරිස් ලෙස කටයුතු කල එම්.ජේ.එස්.වීරසිංහ යන අය විසින් 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතේ 28 වගන්තිය ප්‍රකාරව යම් ඉඩම් ප්‍රමාණයක් කුඹුරු ඉඩමක් ද යන්න තීරණය කිරීමට තමා සතු බලතල යටතේ කටයුතු කරමින් 2017.02.14 දින තම අංක 7/11/19/එම්එල්/211 දරණ ලේඛනය මගින් මෙම දේපල ගොඩ ඉඩමක් ලෙස සලකා කටයුතු කලයුතු බව දක්වා තිබේ. වැඩ බලන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කල ඩී.ඩී.බන්දුලසේන මහතා විසින් ද ඉහත කී ඉඩම ගොඩ ඉඩමක් ලෙස සලකා කටයුතු කල බවට නිකුත් කල සහතිකය අවලංගු කර නොමැති බව හා තාවකාලිකව අවලංගු කල ලේඛන සමග ගැටීමක් ඉන් ඇති නොවන බව ද පරීක්ෂණ අවස්ථාවේදී කරුණු දක්වා ඊට අත්සන් තබා තහවුරු කර තිබේ.

එමෙන්ම මෙම දේපලේ මුල් හිමිකාර පියරත්න යන අය විසින් ගොනුවට ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශය වෙත අවධානය යොමු කරන ලදි. එයට අනුව දක්වා ඇත්තේ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙතින් ලද ගොඩ ඉඩමක් බවට තහවුරු කල මෙම දේපල පැළඟති වැටකින් වට කර තිබූ බව ද වෙනත් බෝග වගා කරමින් සිටි බැවින් ද කුඹුරු ඉඩම් නාමලේඛනයට ඇතුලත් කර තිබූ එකක් නොවන බවය. එමෙන්ම රජයේ පොහොර සහනාධාර හෝ ලබා නොගත් ඉඩමක් බවය. එමෙන්ම පලාපත්වල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී. දිල්රුක්ෂි ලංකාර මිය විසින් 2016.12.23 දිනැති තම අංක : 5/1/59 දරණ ලිපිය මගින් පැමිණිලිකරුට දන්වා ඇත්තේ මෙම දේපලට අදාල තොරතුරු තම කාර්යාලයේ කුඹුරු ඉඩම් නාමලේඛනයේ සඳහන් වී නොමැති බවය. එසේනම් පරීක්ෂණ දිනයන්හිදී කුඹුරු ඉඩමක් බවට ප්‍රකාශ කරමින් 02 වන සහ 03 වන වගඋත්තරකරුවන් කරුණු ප්‍රකාශ කරන ලද්දේ කුමන පදනමකින් ද යන්න තහවුරු නොවේ. එසේම පොහොර සහනාධාර සහ මුදල්

සහනාධාර ලබාගත් බව දක්වා ඇති අතර එසේ පොහොර හා මුදල් සහනාධාර ලබා නොගත් බව මෙම දේපලේ මුල් හිමිකරු ද දිව්රුම් ප්‍රකාශයක් මගින් තහවුරු කර ඇති අතර එලෙස මෙම දේපල වෙනුවෙන් මුදල් හා පොහොර සහනාධාරය ලබාගන්නා ලද්දේ කව්රුන්ද යන්න පිළිබඳව හෝ නැතිනම් ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙතින් පොහොර හා මුදල් සහනාධාර නිකුත් කරමින් යම් වංචා සහගත ක්‍රියාවක් සිදු කර තිබේද යන්න පිළිබඳව ගැටළුවක් මතුවේ. රාජ්‍ය මුදල් හා දේපල අයථා භාවිතයකට ගෙන තිබේද යන්න පිළිබඳ සොයා බලා ඊට අදාල නීතිමය පියවර ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ගතයුතු බව ද මෙහිදී කිවයුතුය. එමෙන්ම කුඹුරු ඉඩමක් බවට කුඹුරු ඉඩම් නාමලේඛනයේ නොමැති නම් 02 වන සහ 03 වන වගඋත්තරකරුවන් විසින් ගොවිජන සංවර්ධන පනතේ බලතල යටතේ කටයුතු කළ නොහැකි ගොඩ ඉඩම් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කුමන නීතිමය පදනමක් මත ද යන්න ගැටළුවක් වේ. එමෙන්ම වර්තමානය වනවිට කුඹුරු ඉඩම් නාමලේඛනයට නම ඇතුලත් කිරීමට ක්‍රියා කර තිබේනම් වර්තමාන හිමිකරු වන පැමිණිලිකරුට නොදන්වා එසේ සිදු කර තිබීමට ගැටළුවක් වන බව පැහැදිලි වේ. ගොඩ ඉඩමක් ලෙස සලකා කටයුතු කළ යුතු බවට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් දක්වා තිබියදී මෙම දේපලට එරෙහිව 02 වන සහ 03 වන වගඋත්තරකරුවන් කටයුතු කරනු ලබන්නේ. පුද්ගලික ගොඩ ඉඩමක අයිතිවාසිකම් වලට එරෙහිව ක්‍රියා කරමින් බව ද තහවුරු වේ. 2021.02.09 දින ද ගොවිජන සංවර්ධන කොමසාරිස් වෙතින් ලිඛිත විමසීමක් කරමින් මෙම දේපල ගොඩ ඉඩමක් ලෙස සැලකිය හැකිද නැත්නම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩමට අදාලව වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද යන්න විමසා සිටින ලදී. එයට පිළිතුරු ලබා දෙමින් 2021.03.04 දින තම අංකː 7/7/2/HRC/2927/17 යටතේ ගොවිජන සංවර්ධන කොමසාරිස්. ඒ.එම්.එම්.එල්.අබේරත්න මහතා දක්වා ඇත්තේ 2017.02.14 දිනිත අංක : 7/11/19/ML/211 දරණ සහතිකය ගොවි ජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් මෙම දේපල කුඹුරු ඉඩමක් නොවන බවට සහතික කර ඇති බවය. එමෙන්ම විකිණීමට. පැවරීමට එරෙහිව කොන්දේසි පනවා ද නොමැති බවය. තවද වර්තමාන හිමිකරු පැමිණිලිකරු බවද විකුණුම්කරයක් මගින් ඔහු මිලදී ගත් දේපලක් බවද දක්වා තිබේ.

ඒ අනුව මෙම පැමිණිලිකරු සතු දේපල ගොඩ ඉඩමක් ලෙස සැලකිය යුතු බවද ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කළ ගොවිජන සංවර්ධන කොමසාරිස් වරුන් දෙදෙනෙකු වන එම්.කේ.එස්.වීරසිංහ මහතා සහ ඩී.ඩී.බන්දුලසේන මහතා යන අය විසින් මෙන්ම වර්තමානයේ කොමසාරිස් ජනරාල් ලෙස කටයුතු කරන ඒ.එම්.එම්.එල්.අබේරත්න මහතා විසින් ද වසර හතරක කාලය තුළ ඔවුන්ගේ ඒ ඒ සේවා කාලයන්හිදී තහවුරු කර ඇති බව ද තහවුරු කරන ලදී.

**නිර්දේශය :**

1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) වන ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් 02 වන සහ 03 වන වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බව නිර්දේශ කර ඒ අනුව පහත පරිදි කටයුතු කළයුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මින් නිර්දේශ කෙරේ.

1. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් එම්.ජ්.එස්.වීරසිංහ මහතා විසින් සහතික කල 2017.02.14 දිනැති අංක : 7/11/19/ML/211 දරණ සහතිකය ප්‍රකාරව ද වැඩ බලන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ලෙස සේවය කල ඩී.ඩී.බන්දුලසේන මහතා විසින් විසින් ඉහත සඳහන් අංක හා දින දරණ බලපත්‍ර තවදුරටත් වලංගු එකක් බවට කරන ලද ප්‍රකාශය අනුව ද ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ලෙස දැනට සේවය කරනු ලබන ජ්.එම්.එම්.එල්.අබේරත්න මහතා විසින් මෙම දේපල ගොඩ ඉඩම් දේපලක් ලෙස සලකා කටයුතු කළ යුතු බවට යළි 2021.03.04 දින කරුණු වාර්තා කර පෙර සහතික බලපත්‍රය තවදුරටත් වලංගු බවට දක්වා තිබීම මත මෙම දේපල ගොඩ ඉඩමක් බව නිර්දේශ කෙරේ.

2. පැමිණිලිකරුගේ දේපල ගොඩ ඉඩමක් බවට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ගොවිජන සංවර්ධන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව ප්‍රකාශ කර තිබියදී ඉඩමේ සංවර්ධන කටයුතු කර ගැනීමට එරෙහිව මාතලේ ගොවිජන සංවර්ධන නිලධාරි සහ කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර විසින් හෝ යම් වෙනත් නිලධාරියෙකු හෝ මගින් තවදුරටත් ඊට එරෙහිව කරනු ලබන ක්‍රියාවන් වැලැක්වීමට ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කළයුතු බවට ද

3. පැමිණිලිකරුගේ දේපල ගොඩ ඉඩම් දේපලක් ලෙස සලකා කටයුතු කිරීමට නිර්දේශ කර තිබියදී ද එම දේපල කුඹුරු ඉඩමක් නොවන බවට කුඹුරු ඉඩම් නාමලේඛනයේ තිබෙන බව සහතික කර තිබියදී ද එකී දේපල වෙනුවෙන් කුඹුරු ඉඩම් යටතේ දක්වා මුදල් හා පොහොර සහනාධාර හෝ කුඹුරු ඉඩම් සඳහා හිමි වෙනත් සහන ලබාගත් නිලධාරීන්ට එරෙහිව කරුණු පරීක්ෂා කර බලා පියවර ගතයුතු බවට ද

4. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ඉහත සඳහන් නිර්දේශයන් ප්‍රකාරව කටයුතු කරමින් දෙවන වගඋත්තරකරු විසින් පැමිණිලිකරුගේ මෙම දේපල ගොඩ ඉඩම් නාම ලේඛනයට ඇතුලත් කිරීමට පියවර ගතයුතු බව ද

5. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් මෙම දේපල ගොඩ ඉඩමක් ලෙස සලකා කටයුතු කළහැකි බවට දක්වා ඇති ලේඛන ප්‍රකාරව ද විකිණීමට අන්සතු කිරීමට බාධාවක් නොමැති බව දක්වා තිබීම අනුව ද කටයුතු කරමින් එකී ඉඩම සංවර්ධනය කිරීමට හෝ වගා කටයුතු සිදු කිරීමට හෝ අන්සතු කිරීමට පැවරීමට හෝ විකිණීමට පැමිණිලිකරුට අයිතිවාසිකම් ඇති බවට ද ඒ අනුව මෙම දේපල සම්බන්ධව පැමිණිලිකරු යම් ආයතනයක් වෙත ඉදිරිපත්ව කටයුතු කිරීමේදී එකී ආයතන විසින් ගොඩ ඉඩමක් ලෙස සලකා මෙම දේපලට අදාළ කටයුතු සිදු කර දියයුතු බවට ද මින් නිර්දේශ කරනු ලැබේ.

2021.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත නිර්දේශ කරනු ලැබේ.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දීමට කටයුතු කළයුතු අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සළකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

දි/- Dr.Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි.
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka